# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1815/30 - 2013 ජුනි මස 22 වැනි සෙනසුරාදා - 2013.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

### කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

මුතුපටිං ගෙදර සුනිමල් පුෂ්පකුමාර නම් වූ සභිකයා අයත් වන ජනතා විමුක්ති පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30)ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ඩී. කේ. නිශාන්ත දසනායක මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි මුදියන්සේලාගේ කුමුදු සමන් ශ්‍රී රත්නායක වන මම, ඩී. කේ. නිශාන්ත දසනායක මහතා කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සමන් ශ්‍රී රත්නායක,
තේරීම්භාර නිලධාරි,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව.

2013 ජුනි මස 10 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මහනුවර.

07 - 184

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත 10අ (1)(අ) වගන්තිය යටතේ දැන්වීම**

වීරකැටිය ප්‍රාදේශීය සභාව

වීරකැටිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන වැල්ලහේනගේ චන්ද්‍රපාල මහතා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව වීරකැටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී වේවැල්වල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්. එච්. ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරි,
වීරකැටිය ප්‍රාදේශීය සභාව.

2013 ජුනි මස 05 වන දින,
මැතිවරණ කාර්යාලය,
හම්බන්තොට.

07 - 185

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.